බස්නාහිර පළාතේ, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය

(පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය - බස්නාහිර පළාත)

තනතුරු ඇබෑර්තු

මාර්ග සහ මාර්ග ආශ්‍රිත ඉදිකිරීම් වැඩි දියුණු කිරීම සහ නඩත්තු කිරීම තුළින් මහජනතාවගේ ප්‍රවාහන කාලය අවම කර සුව පහසු සහ ආරක්ෂිත මාර්ග පද්ධතියක් උරුම කර දීම තුළින් ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කර, පළාත් අතර සම්පත් බෙදීයාමේ විෂමතාවය අවම කිරීමේ අරමුණින් මෙම අධිකාරිය පිහිටුවා ඇත. ඒ අනුව, එම අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළ වන පහත තනතුරු ඇබෑර්තුව සඳහා ක්‍රියාශීලී සහ ස්වයං උද්‍යෝගී ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ඉංජිනේරු (ද්‍රව්‍ය) - තනතුරු - 01

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත්, ද්‍රව්‍ය ඉංජිනේරු (Material Science)/ සිවිල් ඉංජිනේරු උපාධිය ලබා තිබීම.

සහ

2017 අංක 04 දරන පනත මඟින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ආශ්‍රිත ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම හා එසේ ලියාපදිංචි වීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එක (01) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහන 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකාර" (JM – 1-1) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

2017 අංක 04 දරන පනත මඟින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ සංස්ථාගත ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

වැටුප : කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව අනුමත වැටුප් ව්‍යුහය

MM 1-3 - රු.96,650 - 10 X 2,480 - 15 X 3,450 - 173,200

ඉහත වැටුප් ව්‍යුහයට අනුව වැටුප් ගෙවීම 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

(2026 ජනවාරි මස සිට රු.85,896/=)

වයස : අවු: 22 ට නොඅඩු විය යුතු අතර අවු: 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

➢ **පොදු කොන්දේසි : -** බස්නාහිර පළාත තුළ වසර තුන (03) ක ස්ථිර පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දේ.

- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම
- ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

➢ **පත්වීමේ ස්වභාවය :** - ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා හිමිකම් සහිතයි.

➢ **අමතර ප්‍රතිලාභ**

- රජයේ අනුමත ජීවන වියදම් දීමනාව
- රජයේ අනුමත අතෙකුත් දීමනා
- රජයේ අනුමත ණය පහසුකම්

අයදුම් කිරීම :

01. ජීව දත්ත තොරතුරු සමඟ ඥාතීන් නොවන, තමන් පිළිබඳව නිර්දේශ කළ හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංකයන්, අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා වන සහතිකවල පිටපත් සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් තම අංශ ප්‍රධානියාගේ නිර්දේශය සහිතවත්, එසේම දැනටමත් රජයේ/ සංස්ථාවන්හි/ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සේවයේ නියුතු අය ඔවුන්ගේ අයදුම්පත්, තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ද ඉදිරිපත් කළ යුතුය
02. අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි, අදාළ තනතුරු නාමය සඳහන් කළ යුතුය.
03. සියලු අයදුම්පත් 2026.11.23 දින හෝ එදිනට ප්‍රථම පහන සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. 2026.11.23 දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති, බස්නාහිර පළාතේ, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය
අංක: 59, ශාන්ත සෙබස්තියන් කන්ද,
කොළඹ 12.
දුරකථනය : 011 2321996, 0714526202

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED